## 11 - පුරවැසි අධ්‍යාපනය - 1 ( පිළිතුරු )

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 11 | 2 | 21 | 2 | 31 | 2 |
| 02 | 3 | 12 | 2 | 22 | 3 | 32 | 3 |
| 03 | 1 | 13 | 2 | 23 | 3 | 33 | 1 |
| 04 | 3 | 14 | 3 | 24 | 4 | 34 | 3 |
| 05 | 3 | 15 | 3 | 25 | 3 | 35 | 4 |
| 06 | 3 | 16 | 4 | 26 | 4 | 36 | 3 |
| 07 | 4 | 17 | 3 | 27 | 3 | 37 | 1 |
| 08 | 3 | 18 | 3 | 28 | 4 | 38 | 4 |
| 09 | 3 | 19 | 4 | 29 | 4 | 39 | 2 |
| 10 | 4 | 20 | 2 | 30 | 3 | 40 | 4 |

## පුරවැසි අධ්‍යාපනය - 11 ( පිළිතුරු )

01.

1. සීලර් / ඒබ්‍රහම් ලින්කන්

11. දේශපාලන බලය / ආර්ථික බලය / සමාජ බලය / පරිපාලන බලය

111. ඡන්ද කොට්ඨාසයට වග කියන නියෝජිතයකු තෝරා ගැනීමට අවස්ථාව ලැබීම.
ප්‍රාදේශීය මට්ටමින් දේශපාලන නායකයන් බිහිකර ගැනීමට අවස්ථාව ලැබීම.
ප්‍රාදේශිය සංවර්ධනයට ඉඩ ප්‍රස්ථා ලැබීම.
කිසිදු භේදයක් නොසලකා මහජන මතය නියෝජනය වන පරිදි නියෝජිතයන් තෝරා පත්කර ගැනීමට අවස්ථාව ලැබීම.

1v . සිංහල / දෙමළ / මුස්ලිම්/ බර්ගර් / මැලේ /ශාඩි / වැදි / අභිකුන්ඨික

V. 13 වන ව්‍යවස්ථා සංශෝධනය
1987 අංක 42 දරණ පළාත් සභා පනත

V1. යාපනය / මුලතිව් / කිලිනොච්චිය / මන්නාරම / වව්නියාව

V11. ප්‍රාග්ධන සූක්ෂ්ම / ශ්‍රම සූක්ෂ්ම

V111. අල් - කුර් ආනය / සුන්නාස් / ඉජ්මා / කියාස්

1x. 1928 ඩොනමෝර් කොමිෂන් වාර්තාව
1947 සෝල්බරි කොමිෂන් වාර්තාව
1957 බණ්ඩාරණායක - චෙල්වනායගම් ගිවිසුම
1980 දිස්ත්‍රික් සංවර්ධන සභා පිහිටුවීම
1965 ඩඩ්ලි සේනානායක - චෙල්වනායගම් ගිවිසුම

x. ළමා ශ්‍රමිකයින් ලෙස ළමයින් සේවයේ යොදවා ගැනීම.
ළමයින් විවිධාකාර වූ අපයෝජන වලට ලක් වීම
ළමයින් පැහැරගෙන යාම
පාසල් නොයැවීම.
විවිධ ත්‍රස්තවාදී කණ්ඩායම් ළමයින් සෝල්දාදුවන් ලෙස යුධ කටයුතු වල යොදවා ගැනීම.
වධ හිංසා වලට ලක් කිරීම.

( එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20 )

02. 1. මැතිවරණයට ඉදිරිපත් වන දේශපාලන පක්ෂ හෝ කණ්ඩායම් විසින් ඉදිරිපත් කරන ප්‍රතිපත්ති සැලකිල්ලට ගෙන තම ඡන්දය නිවැරදිව ප්‍රකාශ කිරීම.
සමාජයේ ආදර්ශවත් චරිත ලෙස කැපී පෙනෙන අපේක්ෂකයන් තෝරා පත් කර ගැනීම.
උදාර නායකයන් තෝරා පත් කර ගැනීම.
වැරදි ක්‍රියාවල නිරත පුද්ගලයන් බලයට පත් නොකිරීම.

( ලකුණු 02 )

11. සාකච්ඡා මගින් තීරණ වලට එළඹීම
විරුද්ධ මත ඉවසීම
බහුතර මතයට ගරු කිරීම
සහයෝගයෙන් කටයුතු කිරීම
මානව අයිතිවාසිකම් ගරු කිරීම
නීති ගරුක වීම. අයිතිවාසිකම්
භුක්ති විඳිමින් යුතුකම් ඉටු කිරීම

( ලකුණු 03 )

111. වර්තමාන රාජ්‍යය භූමි ප්‍රමාණයෙන් විශාල වීම
වර්තමාන රාජ්‍යය අධික ජනගහනයකින් සමන්විත වීම
සියලු පුරවැසියන් එක් ස්ථානයකට රැස් කිරීමේ අපහසුව
සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම

( කරුණු දෙකට ලකුණු 02 )
( විස්තරයට ලකුණු 03 )

03. 1. ඒක පක්ෂ / ද්වි පක්ෂ / බහු පක්ෂ

( ලකුණු 02 )

11. අත්තනෝමතික පාලනයක් බිහිවීම වැළැක්වීම.
ජන මතය නියෝජනයට ඇති ඉඩකඩ පුළුල් වීම.
බහුවිධතාව තුළින් එක්සත් බව ගොඩනැඟීම.
ආණ්ඩු පක්ෂයේ අහිතකර ප්‍රතිපත්ති විවේචනය කිරීම තුළින් ඒවා නිවැරදි කර ගැනීමට අවස්ථාව සැලසීම.
ජන සමාජයේ පවතින විවිධත්වය නිරූපණය වීමට අවස්ථාව සැලසීම.

( ලකුණු 03 )

111. වඩා යහපත් විකල්ප ආණ්ඩුවක් පිහිටුවීමට ක්‍රියා කිරීම.
ආණ්ඩු පක්ෂයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රතිපත්ති වලට හා ක්‍රියාවන්ට විරුද්ධත්වය දැක්වීම.
ආණ්ඩු පක්ෂයේ ක්‍රියාකාරකම් ගැන සොයා බලා යහපත් විවේචන තුළින් ආණ්ඩුව සුමගට යොමු කිරීම.
ආණ්ඩු පක්ෂය විසින් ඉටු කරනු ලබන යහපත් කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දීම.

( කරුණු දෙකට ලකුණු 02 )
( විස්තරයට ලකුණු 03)

04. 1. කුමක් , කොපමණ නිෂ්පාදනය කරන්නේ ද?
කෙසේ නිෂ්පාදනය කරන්නේ ද?
කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේ ද?

( ලකුණු 02 )

11. පෞද්ගලික ව්‍යවසායන් දිරි ගැන්වීම.
ආර්ථිකය ලිහිල්කරණය.
පෞද්ගලික දේපළ අයිතියට ඉඩ සලසා දීම.
පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම.
රාජ්‍ය ව්‍යවසාය කටයුතු වලින් ඇත් වීම.
රජය විනිමය පාලනයෙන් ඉවත්වීම.
විදේශ වෙළඳාම සම්බන්ධ බාධා ලිහිල් කිරීම.

( ලකුණු 03 )

111. බහු ජාතික සමාගම් බිහි වීම.
විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ලෝකයට හඳුන්වා දීම.
දේශීය මුදල් විදේශවලට ඇදී යාම.
ශ්‍රම හා ප්‍රාග්ධන සංචලතා.
වෙළඳාමට තිබූ බාධා ඉවත් කරමින් නිර්බාධ වෙළඳාම ඇතිවීම.
ලෝකයේ බලවත් රටවල් තම දේශපාලන බලය අනෙකුත් රටවලට ව්‍යාප්ත කිරීම.
විවිධ කලාපීය සහයෝගිතා සංවිධාන බිහිවීම.
තොරතුරු තාක්‍ෂණයේ විප්ලවීය වෙනසක් සිදුවීම.

( කරුණු දෙකට ලකුණු 02 )
( විස්තරයට ලකුණු 03)

05. 1. පළාත්බද මහාධිකරණය
මහාධිකරණය
දිසා අධිකරණය
මහේස්ත්‍රාත් අධිකරණය

( ලකුණු 02 )

11. රජය සම්බන්ධ නඩුවල දී අවශ්‍ය නීති උපදෙස් ලබා දීම.
රජය වෙනුවෙන් හෝ රජයට එරෙහි ව හෝ කාර්යයන් ගොනු කිරීම.
පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන පනත් වලට අවශ්‍ය නීතිමය උපදෙස් ලබා දීම.
ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පවත්වනු ලබන නඩුවල දී පාර්ශ්වකරුවකු ලෙස සහභාගි වීම.
රජයේ හා රාජ්‍ය ආයතන සම්බන්ධ නඩුවලට රජය වෙනුවෙන් පෙනී සිටීම.
මරණ දඬුවම නියම වූවකුගේ එම දඬුවම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිර්දේශ ජනාධිපතිවරයාට ලබා දිම.

( ලකුණු 03 )

111. අධිකරණ අමාත්‍යතුමා
අග්‍රවිනිශ්චයකාරතුමා
නීතිපතිතුමා

( කරුණු දෙකට ලකුණු 02 )
( විස්තරයට ලකුණු 03)

6 1. කැබිනට් ආණ්ඩුක්‍රමයක් හඳුන්වා දීම.
ද්වි මාණ්ඩලික පාර්ලිමේන්තුවක් හඳුන්වා දීම.
අග්‍රාණ්ඩුකාරධූරයක් හඳුන්වා දීම.
අවසාන අභියාචනාධිකරණය ලෙස බ්‍රිතාන්‍ය ප්‍රිවි කවුන්සලය පිළිගැනිම.
රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් හඳුන්වා දිම.
අධිකරණ සේවා කොමිෂන් සභාවක් හඳුන්වා දිම.
සුළු ජාතීන් ගේ අයිතිවාසිකම් සඳහා විශේෂ විධි විධාන හඳුන්වා දිම.

(ලකුණු 02 )

11. ශ්‍රී ලංකාව ස්වාධීන ජනරජයක් බවට පත් කිරීම.
ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් ලෙස ජාතික රාජ්‍ය සභාව හඳුන්වා දීම.
අග්‍රාණ්ඩුකාරධුරය අහෝසිකර ජනාධිපතිධුරයක් ඇති කිරීම.
ශ්‍රී ලංකාවේ අවසාන හා ඉහළම අධිකරණය ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය පිළිගැනීම.
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවීම.
රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය පිහිටුවීම.
රාජ්‍ය සේවා විනය මණ්ඩලය පිහිටුවීම.
අධිකරණ සේවා උපදේශක මණ්ඩලය පිහිටුවීම.
අධිකරණ සේවා විනය මණ්ඩලය පිහිටුවීම.
ප්‍රථම වරට මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයක් ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම.
රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ මූලධර්ම මාලාවක් හඳුන්වා දිම.

(ලකුණු 03 )

111. මහ නගර සභා / නගර සභා / ප්‍රාදේශිය සභා

( කරුණු දෙකට ලකුණු 02 )
( විස්තරයට ලකුණු 03)

7. 1. 1993 දී ශ්‍රී ලංකාවේ කාන්තා ප්‍රඥප්තිය සකස් කිරීම.
කාන්තා කටයුතු සම්බන්ධයෙන් වෙනම අමාත්‍යාංශයක් පිහිටුවීම.
කාන්තාවන්ට වන අසාධාරණකම් සොයා බැලීම සඳහා ජාතික කාන්තා කමිටුව පිහිටුවීම.
ගැහැනු ළමයින්ට සහ කාන්තාවන්ට එරෙහිව කරන වැරදි අපරාධ වශයෙන් දණ්ඩ නීති සංග්‍රහයට ඇතුළත් කිරීම.
ගැහැනු ළමයින්ට සහ කාන්තාවන්ට එරෙහිව නිවස තුළ සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පනත සම්මත කිරීම.
සෑම පොලිසියකම ළමා හා කාන්තා අංශයක් පිහිටුවීම.

(ලකුණු 02 )

11. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පිළිගෙන ක්‍රියාත්මක කිරීම.
ශ්‍රී ලංකාවේ නීති සම්පාදනය කරන විට ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සැලකිල්ලට ගෙන නීති සම්පාදනය කිරීම.
ළමයින් සම්බන්ධව ක්‍රියා කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා පවත්වාගෙන යාම.
පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම.
සෑම පොලිසියකම ළමා හා කාන්තා අංශයක් පිහිටුවීම.
ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ළමා දුරකතන සේවය පිහිටුවීම.

(ලකුණු 03 )

111. නීතිමය යුතුකම්
සදාචාරාත්මක යුතුකම්

( කරුණු දෙකට ලකුණු 02 )
( විස්තරයට ලකුණු 03)